# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2399/25 – 2024 අගෝස්තු මස 27 වැනි අඟහරුවාදා – 2024.08.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2022/94.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

1. නිදහස් වෙළෙඳ කලාප සහ පොදු සේවා සේවක සංගමය, අංක 141, ආනන්ද රාජකරුණා මාවත, කොළඹ 10
2. එල්. එච්. පැතුම් ලක්ෂාන් මයා, අංක 32/බී, ජාඇල වත්ත, වැලිගම්පිටිය, ජා-ඇල

*සහ*

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්, තැ. පෙ. 17, කපුවත්ත, ජා-ඇල

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, පන්නිපිටිය, කඳවල පාර, 55, නීතිඥ බිනර ඒ. ගුණසේකර මයා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2024 අගෝස්තු මස 01 වැනි දින,
කොළඹ දී ය.

1A – G 042584 – 14 (2024/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/02/2022/94.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

1. නිදහස් වෙළෙඳ කලාප සහ පොදු සේවා සේවක සංගමය, අංක 141, ආනන්ද රාජකරුණා මාවත, කොළඹ 10
2. එල්. එච්. පැතුම් ලක්ෂාන් මයා, අංක 32/බී, ජාඇල වත්ත, වැලිගම්පිටිය, ජා-ඇල

*සහ*

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්, තැ. පෙ. 17, කපුවත්ත, ජා-ඇල

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ –**

"ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් හි 2021.04.01 දින සිට සේවයට බැඳී ඇති එල්. එච්. පැතුම් ලක්ෂාන් මහතා සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් සමාගම විසින් අනුගමනය කළ පහත දැක්වෙන ක්‍රියාමාර්ග මගින් අසාධාරණයක් සිදුවී තිබේ ද යන්නත්, එසේ අසාධාරණයක් සිදුව තිබේනම් ඔහුට හිමිවිය යුතු සහන කවරේ ද යන්නත් පිළිබඳව වේ.

- රැකියාව සඳහා පත්වීමේ දී ඔහු පෙරදී දැරූ ආයතනයේ අලෙවි නියෝජිතභාවය අහෝසිකරන ලෙස ඔහු විසින් කර ඇති ඉල්ලීමට ආයතනය කටයුතු කර ඇති ආකාරය
- ආයතනය එම සේවකයාට කරුණු ඉදිරිපත් කිරීමට ලබා දී ඇති අවස්ථාව හා ඔවුන් පරීක්ෂණය පැවැත්වූ ආකාරය
- ආයතනය විසින් 2021.06.28 දින සිට එම සේවක මහතාගේ සේවය වැටුප් රහිතව අත්හිටුවීම් හා මෙතෙක් සේවයට නොකැඳවීම."

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 ජූලි මස 30 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 08 – 0317

---

මගේ අංකය: IR/COM/01/2023/13.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

පී. ඒ. ජී. විජේබණ්ඩා මයා, අංක 170/1-බී, මීගස්තැන්න පාර, උඩුපිහිල්ල, මාතලේ

*සහ*

ප්‍රවාහන සේවා අධිකාරිය, මධ්‍යම පළාත, අංක 595, දිගන පාර, කුණ්ඩසාලේ

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ

ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බත්තරමුල්ල, පැලවත්ත, සිංහපුර පාර, 117, සිරි සිංගප්පුලි මයා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2024 අගෝස්තු මස 08 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2023/13.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

පී. ඒ. ජී. විජේබණ්ඩා මයා, අංක 170/1-බී, මීගස්තැන්න පාර, උඩුපිහිල්ල, මාතලේ

*සහ*

ප්‍රවාහන සේවා අධිකාරිය, මධ්‍යම පළාත, අංක 595, දිගන පාර, කුණ්ඩසාලේ

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ** වනුයේ –

"මධ්‍යම පළාත් ප්‍රවාහන සේවා අධිකාරියේ සේවය කරන පී. ඒ. ජී. විජේබණ්ඩා මහතා 2005.07.07 දින වැඩ තහනමට ලක්ව නැවත සේවයේ පිහිටුවීමේ දී මතු සඳහන් හිමිකම් ඔහුට තිබේ ද එසේ නම් එම හිමිකම් ලබා නොදීම තුළින් ඔහුට අසාධාරණයක් සිදුව තිබේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේ ද? යන්නත් පිළිබඳව වේ.

1. නැවත සේවයේ පිහිටුවීමේ දී 2001 වර්ෂයේ දී පත්වීම් ලද සහකාර ප්‍රාදේශීය කළමණාකාර තනතුර සඳහා හිමිකමක් තිබේ ද යන්න හා එසේ හිමිකමක් තිබේ නම් එම තනතුරෙහි නොපිහිටුවීම.
2. නැවත සේවයේ පිහිටුවීමේ දී අදාළ වැටුප් පරිමාණ හා වැටුප් තලයන් සඳහා හිමිකමක් තිබේ ද යන්න හා එසේ හිමිකමක් තිබේ නම් එම වැටුප් තලයන්හි නොපිහිටුවීම.
3. වැඩ තහනමට ලක්ව සිටි කාලය සඳහා හිඟ වැටුප් හිමිකමක් තිබේ ද, හිමිකමක් තිබේ නම් එය ලබා නොදීම."

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 අගෝස්තු මස 07 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 08 – 0318

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.